කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

නීති පීඨය

නීතිවේදී උපාධි පරීක්ෂණය, III වසර-2017

# ව්‍යවස්ථා සහ ලේඛන අර්ථ නිරූපණ නීතිය

(පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: 07

ඕනෑම ප්‍රශ්න __හතරකට පමණක්__ පිළිතුරු සපයන්න

(අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.)

---

1. අර්ථනිරූපණ කලාව රඳා පවතින්නේ, යමෙකුගේ ස්වකීය පූර්ව මතවාද සහ එල්බගැනීම් අත්හැර දමමින් ව්‍යවස්ථාදායකයාගේ සිතුම්පැතුම් හී දිශානතිය සම්පූර්ණයෙන් අගය කිරීම මතය.

   අදාළ දාර්ශනික හා නීතිවිද්‍යාත්මක විවාදයන් අශ්‍රිතව ඉහත ප්‍රකාශය පිළිබඳව අදහස් දක්වන්න. අදාළ අධිකාරීන් ඇසුරින් ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

2. නීතිවිශාරදයන් ප්‍රකාශකර සිටින්නේ, අර්ථ නිරූපණ න්‍යායයන් තම පැවැත්ම තහවුරු කර තිබෙන්නේ, ඒ ඒ න්‍යායයට අනන්‍ය වූ, හරයාත්මක පදනම් මත නොව අන්‍ය න්‍යායයන්ගේ පූර්ණ හා අතිශය අප්‍රමාණිකතා පෙනවා දීමෙන් බවය.

   ඔබ එකගවන්නෙහිද? තෝරාගත් අර්ථනිරූපණ න්‍යායයන් තුනක් ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න. ඔබගේ පිළිතුර, නඩු තීන්දු නීතියෙන් සහ අවම වශයෙන් වෙනත් අධිකරණ බල ප්‍රදේශ දෙකකින් උපුටා දැක්වෙන උදාහරණ මගින් තහවුරු කළ යුතුය.

3. වර්ෂ 2016 ජනවාරි මාසයේදී සීලන්තය *"2016 අංක 02 දරන සත්ව කෘෘරත්වය වැළැක්වීමේ පනත"* පනවන ලදී. පනතින් උපුටා ගන්නා ලද වගන්ති පහත පරිදි වේ.

01 වගන්තිය

*සතුන් මත අනවශ්‍ය වේදනාවන් හෝ පීඩාවන් පැනවීම වැළැක්වීම සහ එකී අරමුණ උදෙසා සත්ව කෘෘරත්වය වැළැක්වීමට අදාළ නීතිය සංශෝධනය කිරීම සඳහා වන පනතකි.*

*දීර්ඝ නාමය*

05 වගන්තිය

මෙම පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව ලියාපදිංචි වී ඇතිනම් මිස, කිසිදු තැනැත්තකුට කිසිදු ඉදිරිපත්කිරීමක් කරනු ලබන සත්වයකු ප්‍රදර්ශනය කිරීම හෝ පුහුණු කිරීම නොකළ යුත්තේය.

*කෙසේවූවද, සත්වයින්ගේ යහපැවැත්ම තහවුරු කිරීම සඳහා සහ විනෝදයක් සැපයීමේ ඒකායන දැක්මෙන් යුතුව එකී සතුන්ට අනවශ්‍ය වේදනාවක් හෝ විඳවීමක් ඇතිකරවීම වැලැක්වීම සඳහා අවශ්‍ය සියලුම සාධාරණ පියවර ගැනීම, යම් සත්වයකුගේ රැකවරණය හෝ භාරකාරත්වය දරන සෑම පුද්ගලයකුගේම යුතුකම විය යුත්තේය.*

*ඉදිරිපත්කිරීම කරනු ලබන සත්වයන් ප්‍රදර්ශනය හෝ පුහුණු කිරීම පිළිබඳ සීමාකිරීම*

21 වන වගන්තිය

'**ප්‍රදර්ශනය**' යන්නට ප්‍රදර්ශනය කිරීමක් හෝ ප්‍රවේශපත්‍ර අලෙවි කිරීමෙන් ප්‍රෙක්ෂකයින් ඇතුලත් කර ගනුලබන, මහජනයා වෙත විනෝදය සැපයීම සඳහා කරනු ලබන දෙයක් ඇතුලත් වේ.

'**පුහුණුකිරීම**' යනුවෙන් අදහස් වන්නේ ප්‍රදර්ශනය කිරීමේ අරමුණින් යුතුව පුහුණුකිරීමයි.

ඒ අනුව '**ප්‍රදර්ශකයා**' සහ '**පුහුණුකරු**' යන වචනවලට පිළිවෙලින් ඉහත අර්ථයන්ට සමගාමී අර්ථඇත.

*අර්ථනිරූපණය*

සීලන්තයේ සත්ව සුබසාධන මණ්ඩලයේ අවසරයෙන් පවත්වනා ලද විමර්ශනයකදී, විමර්ශකයින් විසින් 2017 ජනවාරි 14,15 සහ 16 යන දිනයන්හි දී පැවැත්වූ, ගවයින් යෙදූ කරත්ත ධාවන තරගයක් නිරීක්ෂණය කරන ලදී. සීලන්තයේ පවත්වනු ලැබූ ගවයින් යෙදූ කරත්ත ධාවන තරගය, සත්ව කෘෘරත්වය වැළැක්වීමේ පනතේ 5 සහ 21 වන වගන්ති එනයින්ම උල්ලංඝනය කරන බව මණ්ඩලය තීරණය කරයි. මණ්ඩලය තම වාර්තාව, දිවුරුම් ප්‍රකාශ සහ ඡායාරූප හරහා, තරගය පැවැත්වූ

ආකාරය සහ එහිදී මනුෂ්‍යයන්ගේ සතුට සහ විනෝදය උදෙසා, ගවයින්ට ශාරීරික සහ මානසික වදහිංසා පැමිණවූයේ කෙසේද යන්න විදහා දක්වන ලදී.

ගවයින් යෙදූ කරත්ත ධාවන තරගයේ සංවිධායකයින්ගේ ස්ථාවරය වූයේ, කෝවිල් උත්සව සමය අතරතුර පැවැත්වෙන මෙකී තරග ග්‍රාමීය ජන ජීවිතයට සාම්ප්‍රදායිකව සහ සමීපව බැඳී තිබෙන අතර බවයි. මෙම තරගයට සහභාගී වන ගවයින්ට කිසිදු ආබාධයක් හෝ වේදනාවක් ඇති නොවීම තහවුරු කිරීම සඳහා දැඩි අවධානයක් සහ පූර්ව ආරක්ෂාවන් ගෙනතිබූ බවත්, ග්‍රාම නිළධාරීන් සහ පොලිස් නිළධාරීන් නිරතුරුව සත්ව කෲරත්වය වැළැක්වීම සඳහා රාජකාරියේ යොදවා තිබූ බවත් ඔවුහු තවදුරටත් ප්‍රකාශ කර සිටියහ. තවද, මෙවැනි තරග අතිවිශාල ජනකායක් ආකර්ශනය කර ගන්නා අතර ඒ හරහා රාජ්‍යයට ආදායම් උත්පාදනය වන බවත් , මහජනයාට විනෝදයක් ලබා දෙන බවත්ය. එසේම, ඔවුන්ගේ ස්ථාවරය වූවේමෙම තරගය නැරඹීම සඳහා ප්‍රවේශපත්‍ර විකිණීමක් සිදුනොවූ බැවින් මෙකී තරගයට යොදාගත් ගවයින් 5 වන වගන්තියේ අර්ථයට අනුව " ඉදිරිපත්කිරීමක් කරනු ලබන සත්වයින්" නොවන බවයි.

ඔබ මෙම නඩුවේ විනිසුරු යැයි උපකල්පනය කරමින් සත්ව කෲරත්වය වැළැක්වීමේ පනතේ අදාල ප්‍රතිපාදන පිළිබඳව වන ඔබේ අර්ථනිරූපණය විස්තරාත්මකව දැක්වෙන සහේතුක නඩුතීන්දුවක් ලියාදක්වන්න. සීලන්තයේ නීති පද්ධතිය ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට සමාන බව උපකල්පනය කරන්න.

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදය සහ නීතියේ බලය ඉහළ නංවමින්, ස්වකීය නිර්මාණශීලී අර්ථනිරූපණය හරහා, රාජ්‍යයේ පුරවැසියන්ගේ ජීවිත වලට සාධනීය වෙනස්කම් ගෙනඒමේ අද්විතීය බලයක් අධිකරණයට තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්ථනිරූපණය හරහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදය සහ නීතියේ බලය ඉහල නැංවීම පිණිස ශ්‍රී ලාංකේය අධිකරණය විසින් ගනු ලැබූ මෑතකාලීන උත්සාහයන් ආශ්‍රිතව ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න. ඔබ අවම වශයෙන් තවත් එක් අධිකරණ බලප්‍රදේශයක් හෝ සමග ශ්‍රී ලාංකේය අධිකරණ ප්‍රවේශය සංසන්දනය කළ යුතුය.

5. අ සහ ආ කොටස් දෙකටම පිළිතුරු සපයන්න

අ) මෙගාලන්තයේ 2000 අංක 18 දරන ආනයන පනතේ 2 වන වගන්තියේ මෙසේ දැක්වෙයි:

*"රන්, රිදී, ප්ලැටිනම්, පැලැඩියම් සහ වෙනත් යම් වටිනා ලෝහයක් ආනයන කරන ආනයනකරුවන්, ආනයන අවසර පත්‍රයක් ලබා ගත යුතුය"*

තම කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු සඳහා තඹඩු ආනයනය කිරීමට අජිත්ට අවශ්‍ය වන අතර ඉහත කී පනතේ 2 වන වගන්තියේ අදාළතාවය පිළිබඳව ඔහු ඔබගේ උපදෙස් පතයි. අජිත්ට උපදෙස් දෙන්න. (ලකුණු 7.5)

ආ) මෙගාලන්තයේ පෞද්ගලික පාසලක් වන "ආසියානු විද්‍යාලයේ" භාරකාර මණ්ඩලයට එහි වත්මන් විදුහල්පතිවරයා සේවයෙන් නෙරපා දමා එකී පුරප්පාඩුව පිරවීමට අවශ්‍ය වී තිබේ.

මෙගාලන්තයේ 2000 අංක 25 දරන අධ්‍යාපන පනතේ 20 සහ 35 වගන්ති පහත පරිදි වේ.

**20 වන වගන්තිය**

අධ්‍යාපන අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබූ රෙගුලාසිය අනුගමනය කරමින්, අධ්‍යාපන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයාට, මණ්ඩලය මගින් ලිඛිතව නිර්දේශ කරනු ලබන ඕනෑම පුද්ගලයකු, සහය ලද පාසලක (assisted school) කළමනාකරු වශයෙන් පත්කළ හැකිය.

මෙම වගන්තිය තවදුරටත් සඳහන් කරන්නේ එකී තීරණය රටේ කම්කරු නීතීන් වලට යටත් වන බවයි.

**35 වන වගන්තිය**

*"සහයලද පාසලක්" යනු රාජ්‍ය මූල්‍ය ආධාර හරහා දායකත්වය ලද පාසලකි.*

ආසියානු විද්‍යාලය මූල්‍යාධාර ලබන්නේ සහ කළමණාකරණය කරනු ලබන්නේ පෞද්ගලික භාරකාර මණ්ඩලයක් මගිනි. 1996 අංක 12 දරන ආසියානු විද්‍යාල පනත තුල ආසියානු විද්‍යාලයේ කළමනාකාරීත්වයට අදාල රීති අන්තර්ගත වේ.

1996 අංක 12 දරන ආසියානු විද්‍යාල පනතේ 10 වන වගන්තිය මෙසේ දක්වයි:

*"එහි සේවකයින්ගේ පත්කිරීම් සහ ඉවත් කිරීම් භාරකාර මණ්ඩලය මගින් සිදුකළ යුතුය."*

ආප්ත සහ අදාල නඩු තීන්දු අධිකාරීන් ඇසුරින් අදාළ ඉවත් කිරීම සහ පත්කිරීම සම්බන්ධව ආසියානු විද්‍යාලයේ භාරකාර මණ්ඩලයට උපදෙස් දෙන්න.

(ලකුණු 10)

6. <u>අ සහ ආ කොටස් දෙකටම</u> පිළිතුරු සපයන්න

අ) අර්ථනිරූපණයෙහි බාහිර ආධාරකයක් වශයෙන් අන්තර්ජාතික ලේඛන යොදාගැනීමේහි ලා ශ්‍රී ලාංකේය අධිකරණමය ආකල්පය ස්ථායි නොවේ.

අර්ථනිරූපණයෙහි ලා අන්තර්ජාතික ලේඛන බාහිර ආධාරකයක් වශයෙන් යොදාගැනීම ඉහත ප්‍රකාශය අසුරින් විවේචනාත්මකව විග්‍රහ කරන්න. ඔබගේ විග්‍රහය තුළ ඒ ආශ්‍රිත ශ්‍රී ලාංකේය අධිකරණමය ආකල්පයෙහි වෙනස්කම් ඉස්මතු කර දැක්විය යුතු අතර, විනිශ්චිත නඩුතීන්දු ඇසුරින් තහවුරු කළ යුතුය.

(ලකුණු 10)

ආ) ස්වකීය නඩුකටයුතු වලට සහාය පිණිස හැන්සාර්ඩ් වාර්තා බාහිර ආධාරකයක් වශයෙන් යොදා ගැනීමේදී, නඩුවේ පාර්ශවයන් සහ ඔවුන්ගේ නීතිඥවරුන් මුහුණදෙන ප්‍රායෝගික අභියෝග පිළිබඳව ඔබේ දැක්ම ඉදිරිපත් කරමින් මතයක් කෙටුම්පත් කරන්න. ඔබගේ මතය අදාළ නඩු තීන්දු මගින් තහවුරු කළ යුතුය.

(ලකුණු 7.5)

7. "ව්‍යවස්ථාදායකය දැඩි, අයුක්තිසහගත හෝ අසාධාරණ වන දැ චේතනා නොකරයි" යන පූර්ව නිගමනය යුක්තියේ මූලික නියාමයන් මගින් පැනනැගී ඇත. එමගින් සෑම නීති පද්ධතියකටම යුක්තියේ, සාධාරණත්වයේ සහ ධර්මිෂ්ඨකමේ ප්‍රමිතීන් කරා ලගාවීමට අවශ්‍ය මාර්ගෝපදේශ සපයයි.

ඔබ එකගවන්නෙහිද? ඉහත පූර්ව නිගමනයේ අනු ඛණ්ඩ සහ විනිශ්චිත නඩු තීරණ මගින් ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

**************************